Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

ශ්‍රේණිය : 6


විෂය : ගණිතය


සතිය : 14

**පාඩම :- සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා**

**කාලච්ඡේද ගණන :- 10**

- පහත දැක්වෙන ගල් කැට ප්‍රමාණ දෙකේ ගොඩවල්වලට වෙන් කරන්න.





පෙළපොතේ 25, 26 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.


1 සිට 10 තෙක් එක් එක් සංඛ්‍යාව දැක්වීමට තිත් රටා අඳින්න. එම තිත් දෙකේ ගොඩවල්වලට වෙන් කරන්න. එම සංඛ්‍යා එක එකක් ඔත්තේ ද ඉරට්ටේ ද යන්න ලියන්න.


උදා:- සංඛ්‍යාව 7




- ඔබ සොයා ගත් ඔත්තේ සංඛ්‍යා ලියන්න.
- ඔබ සොයා ගත් ඉරට්ට සංඛ්‍යා ලියන්න.

"0" ඉරට්ට ද ඔත්තේ ද යන්න පහත රටාව අධ්‍යයනය කරමින් විස්තර කරන්න.





පහත දැක්වෙන සංඛ්‍යා ඔත්තේ හා ඉරට්ටේ සංඛ්‍යා ලෙස වෙන් කර වගුව තුළ ලියන්න.

17, 73, 116, 98, 126, 320, 657, 391, 573, 628, 873, 936

| **ඔත්තේ සංඛ්‍යා** | **ඉරට්ටේ සංඛ්‍යා** |
|---|---|
| | |

උපුල් හා නිමල් ඔවුන්ගේ නිවසේ පිහිටීම හා ඔවුන්ගේ පාසලේ පිහිටීම පහත රූපයේ දක්වා ඇත. උපුල් පාසලට යන්නේ ආරෝහණ ක්‍රමයට අනුපිළිවෙළින් ඉරට්ට සංඛ්‍යා යා කිරීමෙන් ලැබෙන පාර දිගේය. නිමල් පාසලට යන්නේ ආරෝහණ ක්‍රමයට අනුපිළිවෙළින් ඔත්තේ සංඛ්‍යා යා කිරීමෙන් ලැබෙන පාර දිගේය.

I. එලෙස සංඛ්‍යා යා කර ඔවුන් පාසලට යන මාර්ග දෙක ඇඳ දක්වන්න.
II. කෙටිම මාර්ගයෙන් පාසලට ගියේ කවුද?



පෙලපොතේ 27 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න.

පෙලපොතේ 28 පිටුවේ 14.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. 29 පිටුවේ 14.2 අභ්‍යාසය ද නිවැරදිව සම්පූර්ණ කරන්න.

**<u>ප්‍රථමක සංඛ්‍යා හා සංයුත සංඛ්‍යා හඳුනා ගැනීම</u>**

පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | ලිවිය හැකි සාධක | සාධක ගණන |
|---|---|---|
| 1 | 1 | 1 |
| 2 | 1, 2 | 2 |
| 3 | | 2 |
| 4 | 1, 2, 4 | 3 |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | 1, 2, 4, 8 | 4 |
| 9 | | |
| 10 | | |
| 11 | 1, 11 | 2 |
| 12 | | |
| 13 | | |
| 14 | 1, 2, 7, 14 | 4 |
| 15 | | |

ඉහත සංඛ්‍යා අතරින් එකිනෙකට වෙනස් සාධක 2 ක් පමණක් ඇති සංඛ්‍යා මොනවාද?

ඉහත සංඛ්‍යා අතරින් එකිනෙකට වෙනස් සාධක 2 කට වැඩි ගණනක් ඇති පූර්ණ සංඛ්‍යා මොනවාද?

**එකිනෙකට වෙනස් සාධක 2 ක් පමණක් ඇති සංඛ්‍යා ප්‍රථමක සංඛ්‍යා නම් වේ.**



**එකිනෙකට වෙනස් සාධක 2 කට වැඩියෙන් ඇති පූර්ණ සංඛ්‍යා සංයුත සංඛ්‍යා නම් වේ.**

1, ප්‍රථමක සංඛ්‍යාවක් හෝ සංයුත සංඛ්‍යාවක් නොවීමට හේතු ලියන්න.

- පලමු ප්‍රථමක සංඛ්‍යා 15 ලියන්න.
- පලමු සංයුත සංඛ්‍යා 15 ලියන්න.
- ඉරට්ටේ ප්‍රථමක සංඛ්‍යාවක් ලියන්න.
- සංයුත සංඛ්‍යාවක් වන පලමු ඔත්තේ සංඛ්‍යා 5 ලියන්න.

පෙලපොතේ 32 පිටුව බලන්න. එහි ඇති 14.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න

මෙම රටාව තිත් රටාවක් ලෙස පහත දැක්වෙන ආකාරයට පේළි 6ක් දක්වා දීර්ඝ කරන්න.

| රටාව | සංඛ්‍යාව |
| --- | --- |
|  | 1 |
|  | 4 |
|  | 9 |

**සමචතුරස්‍ර රටාවක් ලබා දෙන සංඛ්‍යා සමචතුරස්‍ර සංඛ්‍යා නම් වේ.**



ඉහත රටා උපයෝගී කර ගෙන 100 දක්වා සමචතුරස්‍ර සංඛ්‍යා සියල්ල ලියන්න.

1, 4,9, 16, 25,.......................................................................................................

- සමචතුරස්‍ර සංඛ්‍යා රටාවක ඔබ දකින ලක්ෂණය ලියන්න.
- එකතුව 13 සහ අන්තරය (වෙනස) 5 වන සමචතුරස්‍ර සංඛ්‍යා දෙක ලියන්න.

33 පිටුවේ 14.4 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

සිදුරු විදිනයකින් ලබා ගත් වෘත්තාකාර හැඩ පහත ආකාරයට අලවන්න.

| | | |
| --- | --- | --- |
|  | පේළි ගණන 1 | සංඛ්‍යාව 1 |
|  | පේළි ගණන 2 | සංඛ්‍යාව 3 |
|  | පේළි ගණන 3 | සංඛ්‍යාව 6 |

තවදුරටත් වෘත්තාකාර හැඩ ඇලවීමෙන් පේළි 10 ක් තෙක් සම්පූර්ණ කරන්න.

**ත්‍රිකෝණ රටාවක් ලබා දෙන සංඛ්‍යා ත්‍රිකෝණ සංඛ්‍යා වේ.**

සනකාභ හැඩැති සබන් කැට 28ක් ත්‍රිකෝණ රටාවක් ලැබෙන පරිදි සකස් කර ඇත.

I. එම රටාව ඇද පෙන්වන්න.
II. එම රටාවේ පේළි ගණන කීයද?
III. පහළම පේළියේ ඇති සබන් කැට ගණන කීයද?

පෙලපොතේ **34, 35** පිටු නිවැරදිව අධ්‍යයනය කරන්න. 35 පිටුවේ 14.5 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.

පහත දැක්වෙන සංඛ්‍යා රටාවල ඊළඟ පද දෙක ලියන්න.

I. 3, 5, 7, 9, ............, ..................
II. 1, 4, 9, 16, ............., ................
III. 2, 6, 18, 54, ..............., .................
IV. 1, 3, 6, 10, ............, ..............

**කිසියම් රීතියකට අනුව පිළියෙල කර ඇති සංඛ්‍යා රටාවක එක් එක් සංඛ්‍යාව එම රටාවේ පදයක් ලෙස හඳුන්වයි.**

පෙලපොතේ 36 පිටුවේ 14.6 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

37 පිටුවේ ඇති මිශ්‍ර අභ්‍යාසය අමතර අභ්‍යාසයක් ලෙස නිවැරදිව සම්පූර්ණ කරන්න.

ඔබට මතුවන ගැටළු ගුරුතුමා / ගුරුතුමිය සමඟ සාකච්ඡා කොට නිවැරදි කරගන්න.